

# කොඩියගෙ කොලම

## ලක්ෂමන් කොඩිතුවක්කු

## නගරාධිපතිවරු

**මා ජීවත්වන සිඩ්නි නගරයේ ආසන්න බියුමන්ට් හිල් ප්‍රදේශය අයත් වන්නේ බෝල්කම් හිල් නගර සභාවටය. නගරාධිපති ඇතුළු නාගරික මන්ත්‍රී වරුන් දොළහක් පමණ තනතුරු දරණ බෝල්කම් හිල් නගර සභාව සිඩ්නි නගරයේ ආසන්නව ඇති නගර සභා තුලින් විශාල වපසරියකට හිමිකම් කියන ප්‍රධානතම නගර සභාවක් කිවහොත් එය නිවැරදිය. මෑත කාලයේදී එහි පුරපති ධූරය දරන්නේ කාන්තාවකි. ඇය උගත් බුද්ධිමත් කාන්තාවක් වන අතර ආචාර්ය උපාධියකටද හිමිකම් කියන නගරාධිපතිනියකි. එහෙත් මා මෙම කොලමෙන් ඔබට ලියන්නේ ඇය ගැන නොවේ. ඇය නාගරික මන්ත්‍රීවරියක් ලෙස සිටියදී වසර දෙකක් පමණ එම නගර සභාවේ නගරාධිපති ධූරයක් දැරූ අවංක මිනිසෙකු හා අප උපන් රටේ නගරාධිපතිවරියක් පිළිබඳවය.**

ඔහු මාගේ අසල්වැසියෙකි. දිනපතාම උදේ සවස මුණගැහෙන සිනාසෙන මා ජීවත්වන ප්‍රදේශයේ හිටපු නගරාධිපතිවරයා අද වනවිට නගර සභාවෙන් ඉවත් වී ජීවත් වෙන හැටි ලංකාවේ උපන් මා හට අරුම පුදුම දෙයක් වුවද එය ඕස්ට්‍රේලියාව වැනි රටක උපන් අයෙකුට නම් අරුම පුදුම දෙයක් නොවන බව අපි කවුරුත් දනිමු.

මම ඔහු මැල්කම් ලෙසින් හඳුන්වමි. එය මෙම කතාවේදී මා විසින් ඔහුට දෙන ලද නාමයකි. මැල්කම්ගේ දැන් රැකියාව තණකොළ කැපීමය. ස්වයං රැකියාවක් ලෙසින් ආරම්භ කර ඔහු පමණක් සේවය කරන තණකොළ කප්පාදු කිරීමේ රැකියාව සඳහා ඔහුට බොහෝ ඇණවුම් ඇත්තේය. සියලු ආම්පන්න යන්ත්‍ර සූත්‍ර පටවාගෙන ඔහු හිමිදිරියේ නිවසින් පිටවන්නේය. සවස පස්වරු දෙක පමණ වනවිට ඔහු රැකියාව නිම කර නිවසට පැමිණෙයි. ඔහු බොහෝ කාර්ය බහුල වන්නේ ගිම්හානය සහ වසන්තය එළඹෙන විටය. උෂ්ණත්වය සමඟ තණකොල වේගයෙන් වැවෙන නිසා ඒ කාලයට ඔහුගේ ආදායම ඉහළ යයි. සවසට ඔහු මිදුලට එන්නේ බියර් බෝතලයක් අත දරාගෙනය. එය තොලගාමින්, ඔහු දකින මුණ ගැසෙන අසල්වාසීන් සමඟ වචනයකින් දෙකකින් හෝ දොඩමලු වන්නේය. අඩුම තරමින් සිනාසී හෝ අතවනා යන තරමටම ඔහු කා සමඟත් කුළුපගය.

"ඔබ ඉතින් හිටපු නගරාධිපතිවරයෙක්නේ. කවුන්සලේ කොන්ත්‍රාත් වැඩ එහෙම අල්ල ගෙන ඇති නේද ? මම එසේ ඇසුවේ නගර සභාවට අයත් දේපළවල වැවෙන තණකොළ කැපීමේ ටෙන්ඩර් ඔහුට පහ සුවෙන්ම ලැබෙන බව සිතමිනි.

"නෑ යාළුවා මං කවදාවත් ඒ ටෙන්ඩර්වලට අයදුම්පත් දාන්නෑ. මං තණකොළ කපන්නේ ගෙවල්වල වතුවල, නැත්නම් පෞද්ගලික ඩිස්පැන්සරි, වෛද්‍ය සායන වගේ තැන්. වතුවල වැවෙන ගස්කොලන් අලංකාරව කැපීම, ඒ වගේම චයිල්ඩ් කෙයාර් සෙන්ටර්වල. ඒ ටික කැපුවම මට හොඳටම ඇති. ඔහුගේ සුපුරුදු සිනහව සමඟින් මම ඒ වදන් වලට සවන් දෙමි. නිවාස දහසයක් පමණ ඇති මා පදිංචි මාවතේද බොහෝ නිවෙස්වල කුලියට තණකොළ කපන්නේ ඔහුය. එහෙත් කිසි දිනෙක මා මගේ කුඩා මිදුලේ තණකොළ කැපීමට ඔහුට භාර දී නැත. එය මා මිලදී ගත් තණකොළ කපන යන්ත්‍රයකින් මම විසින්ම කපා ගමි. ඔහුගේ දරුවන් ඉගෙනුම ලබන්නේ ඇති රජයේ පාසලෙනි. එය රවුස් හිල් උසස් පාසලයි. දරුවන් පාසලට යන්නේද පා ගමනිනි. සරළ දිවිපෙවෙතක් ගත කරන ඔහුගේ රැකියාවට සම්බන්ධ උපකරණ සහිත වෑන් රථයට අමතරව තවත් එක් වාහනයක් පමණක් ඇත. ඒ ඔහුගේ පෞද්ගලික ගමන් බිමන් සඳහාය. ඔහු එම වාහනය භාර දී ඇත්තේ බිරිඳටය. නිවසට අවශ්‍ය කළමනා ගෙන ඒමටද, රැකියාව සඳහා ආසන්න නගරයට යාමටද බිරිඳ එම රථය පාවිච්චි කරයි. එහෙත් පහුගිය සතියේ මා තරමක් අසනීප වූ බැවින් මා, මගේ වත්තේ තණකොළ කැපීම ඔහුට භාර කළේය. සීත සෘතුව සමඟ තණකොළ කහ පැහැව මලානික වන හෙයින් එයට පෙර, තරමක් උසට වැවී තිබූ තණකොළ කපා ඔහු ඔහුගේ ගාස්තුව ලබාගත්තේය.

ඊයේ පෙරේදා දිනක ඔහු මට නැවත මුණ ගැසුණේය. ඒ පරණ කොමඩ් වැසිකිළි පෝච්චියක් සමගය. වසරකට දෙවරක් ඉවතලන ගෙදර දොර බඩු මුට්ටු එකතු කරන නගර සභාවේ ට්‍රක් රථයට දැමීම පිණිස ඉදිරිපිට පාර කොනක පරණ බඩු තබනු දුටු ඔහුට මම ලංවී අත වැනුවෙමි.

"ටොයිලට් එකට අළුත් පෝච්චියක් දැම්මා. පරණ එකේ වතුර පියන කැඩිලා ගියානේ. පියනක් දානවට වැඩිය හොඳයි අළුත්ම පෝච්චියක් දාන එක." ඒ පරණ ඉවත ලෑ පෝච්චිය අප කාගේත් නිවෙස්වල ඇති සාමාන්‍ය වැසිකිළි පෝච්චියකි. එය දුටු විට මට මතක් වූයේ මෑතකදී කොළඹ මහ නගර සභාවට පත් වූ පුරපතිනිය වූ රෝසි සේනානායකයි. ඇය පත්වූ විගසම තම නිළ නිවසේ වැසිකිළිය වෙනුවෙන් වියදම් කළ මුදලයි. වැසිකිළි දෙකකට වඩා නගරාධිපති වරුන් දෙපළගේ වෙනස ගැන සිතමින් මම ඔහුට අතවනා සමුදුනිමි. ඒ වෙනස පිළිබඳව මා එතරම් පුදුම නොවූවත්, ඔහු ඒ වෙනස දැනගතහොත් පුදුම වනවා නොඅනුමාන වන බවනම් මම දනිමි.

